# ලංකා බැංකුවේ විශ්‍රාමිකයින්ගේ සංගමය

**1979 සිට සාමාජිකයින් එක්සත්ව සිටී**

# සංගමයේ හතලිස් දෙවන [42] වාර්ෂික මහා සභා රැස්වීම සාර්ථකව පැවැත්වේ.

2021 වසරේ අප්‍රේල් මාසයේ පැවැත්වීමට නියමිතව තිබූ සංගමයේ 42 වන වාර්ෂික මහා සභා රැස්වීම ගෝලීය කොවිඩ් වසංගතයේ බලපෑම මත කල් තැබීමට සිදුවී වසරකට පසු එනම් 2022 අප්‍රේල් මස 30 වන දින, එවකට බලපැවැත්වූ සෞඛ්‍ය නීති රීතීන්ට අනුගත වෙමින් මහරගම ජාතික තරුණ සේවා සභා ශ්‍රවණාගාරයේ දී සාර්ථකව පවත්වන්නට හැකි වූ බව මහා සාමාජිකත්වය වෙත සතුටින් දන්වා සිටිමු. සංගමයේ ව්‍යවස්ථාවේ අංක 7.4.3(1) ට අනුව තේරී පත්වූ 463 දෙනෙකුගෙන් සමන්විත වන මධ්‍යම කාරක සභිකයින්ගෙන් 351 ක් වූ අති බහුතරයක් දිවයිනේ නන්දෙසින් පැමිණ සහභාගි වූ මෙම මහා සභාව එසේ පැවැත්වීමට හැකි වීම රටේ එවකට පැවති තත්වය අනුව සංගමය ලැබූ විශාල ජයග්‍රහනයකි. විශේෂයෙන් සහභාගි වන නියෝජිතයින්ගේ සෞඛ්‍ය ආරක්ෂාව තහවුරු කරමින්, ඔවුන්ගේ ප්‍රවාහන ගැටළු වලට සාධනීය විසඳුම් ලබා දෙමින්, වාර්ෂික මහා සභාව සාර්ථක කර ගැනීම සඳහා මව් සංගමය හා එක්වී දිස්ත්‍රික් සංගම් නායකත්වය ඉටු කරනු ලැබූ සේවය බෙහෙවින් ප්‍රසංසනීය වේ.

2022 අප්‍රේල් මස 30 වන දින උදෑසන 9. 30 වන විටත් අවශ්‍ය ගනපූර්ණය සපුරාලමින්, දිවයිනම නියෝජනය කරමින් නියෝජිතයින් පැමිණ සභාවේ අසුන් ගැනීමත් සමග මුලසුන ගත් සංගම් නිළධාරි මණ්ඩලය මහා සභාවේ කටයුතු ආරම්භ කළේය. සම්ප්‍රදායනුකූල පොල්තෙල් පහන විශේෂ ආරාධිතයින්ගේ සුරතින් දල්වනු ලැබිය. ජාතික ගීය හා ලංකා බැංකු ගීතය ගායනා කිරීමෙන් පසු සභාවේ කටයුතු ආරම්භ වූයේ ප්‍රධාන ලේකම් වී. රාජේන්ද්‍රන් මහතා රැස්වීම කැඳවීමේ නිවේදනය කියවීමත් සමගය.

සංගමයේ ගරු සභාපති එල්.ජී. අබේසිරි ගුණවර්ධන මහතා විසින් විශේෂ ආරාධිත අමුත්තන් ඇතුළු පැමිණ සිටි සියළුම මධ්‍යම කාරක සභික මහත්ම මහත්මීන්ව හරසරින් පිළිගනු ලැබුයේ, විශේෂයෙන් දිවයිනේ දුර බැහැර දිස්ත්‍රික්කය නියෝජනය කරමින් ප්‍රවාහන දුෂ්කරතා විඳ දරා ගනිමින් පැමිණි සාමාජකයින්ට විශේෂ ස්තුතියක් ද පුද කරමිනි.

අනතුරුව මියගිය සාමාජිකයින් සිහිපත් කිරීම උදෙසා විනාඩියක නිශ්ශබ්දතාවයක් පවත්වා ගෞරව දැක්වූ සභාව න්‍යායපත්‍රානුකූලව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී. ප්‍රථමයෙන්ම සංගමයේ උපදේශක සභාව විසින් නිර්දේශ කර තිබුනු විශේෂ යෝජනා අනුමැතිය සඳහා සභාවට ඉදිරිපත් කරනු ලැබිය. එකී යෝජනා නම් 2020/2021 මධ්‍යම කාරක සභාවේ නිල කාලය දීර්ඝ කිරීම, 2021/04/30 දිනට නියමිතව තිබූ වාර්ෂික මහා සභා රැස්වීම 2022/04/30වන දිනට කල් දැමීම, සංගමයේ බාහිර විගණන ආයතනය වශයෙන් "වී ඇසෝසියේට්" (WE Associate) නමැති වරලත් ගණකාධිකාරි ආයතනය තෝරාපත් කර ගැනීම හා සංගමයේ අභ්‍යන්තර විගණකවරයා වශයෙන් බී. එම්. ප්‍රේමරත්න මහතා තෝරා පත්කර ගැනීම යන යෝජනාවයි. වාර්ෂික මහා සභාවේ අපරානුමැතිය සඳහා ඉදිරිපත් වූ මෙම සියළුම යෝජනා සභාව ඒකමතිකව සම්මත කරනු ලැබීම විශේෂයෙන් සඳහන් කළ යුතු සිද්ධියකි.

අනතුරුව ගරු ප්‍රධාන ලේකම්වරයා විසින් 2020 අගෝස්තු මස 22 පැවැති වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදී. (ඒ වන විටත් එම වාර්තාවේ මුද්‍රිත පිටපත් මධ්‍යම කාරක සභික සාමාජිකයන් වෙත ලබා දී තිබිණ.) මධ්‍යම කාරක සභික පී. ඒ. ආර්. එස්. ද සිල්වා සහ එච්.එල්.ජී. වනිගසේකර යන මහත්වරුන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් එම වාර්තාව සභා සම්මත විය.

වාර්තාවෙන් පැන නගින කරුණු පිළිබඳ සංවාදයේ දී මධ්‍යම කාරක සභික කේ. එල්. ජී. හේමරත්න මහතා විසින් මතු කරන ලද ප්‍රශ්නවලට ගරු ප්‍රධාන ලේකම්වරයා විසින් පහත පෙනෙන පිළිතුරු ලබාදෙන ලදී.

### 1. රාජ්‍යය බැංකු විශ්‍රාම සංගම් අතර සන්ධානයක් ගොඩනැගීම සම්බන්ධයෙන් සම්මත කරගත් යෝජනාව

මෙම යෝජනාව ක්‍රියාවට නැංවීම සංගමය පෙරමුණ ගත් නමුත් අනෙකුත් රාජ්‍ය බැංකුවල විශ්‍රාමික සංගම් ඒ පිළිබඳ ප්‍රමාණවත් උනන්දුවක් නොදැක්වීම හේතුවෙන් තාවකාලික විරාමයකට යාමට සිදු වුවත් සංගමය මේ පිළිබඳ උත්සාහය අත්හැර නැත.

### 2. අසනීප නිවාඩු සඳහා මුදල් ලබා ගැනීම.

මේ සම්බන්ධයෙන් කළමනාකාරිත්වයට කරනු ලැබූ ඉල්ලීම ඔවුන් විසින් ප්‍රතික්ෂේප කර ඇත. කෙසේ වෙතත්, මෙම කාරණය සංගමයේ ඉදිරි ක්‍රියාකාරකම් ලැයිස්තුවේ අඩංගු වන අතර පාලන මණ්ඩලය වෛද්‍යාධාර ක්‍රමය සමකිරීම හා විශ්‍රාම වැටුප් වැඩි කර ගැනීම යන ඉල්ලීම් වලට මුලිකත්වය දි කටයුතු කරමින් සිටින බැවින්, ඉන් අනතුරුව අසනීප නිවාඩු සඳහා මුදල් ලබාගැනීම සඳහා යළි සාකච්ඡා අරඹනු ඇත.

සිංහල හා ඉංග්‍රීසි දෙබසින්ම සැකසූ ප්‍රධාන ලේකම්වරයාගේ වාර්ෂික වාර්තාව සියළුම මධ්‍යම කාරක සභිකයන් වෙත තැපැල් කර තිබූ අතර, ලේකම්වරයා ගතවූ කාලපරිච්ඡේදයේ සංගමයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධව ප්‍රධාන කරුණු වලින් සභාව දැනුවත් කළේය. ඒ පිළිබඳ සාකච්ජාවට සභාව විවෘත කලද විමසීම් කිසිවක් නොවූ හෙයින් වාර්තාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.

අනතුරුව සංගමයේ භාණ්ඩාගාරික එන්. ඩබ්. ආර්. ප්‍රනාන්දු මහතා 2020/2021 සහ 2021/2022 මුදල් වර්ෂ සඳහා වූ සංගමයේ මූල්‍ය තත්ත්වය ඇතුලත් වාර්තා ඉදිරිපත් කරමින් සභාව සාකච්ඡාවට විවෘත කළේය. සභික ඩී.එන්.ජේ. දිසානායක මහතා සංගමයේ සාහිත්‍ය ප්‍රකාශන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මතුකල ප්‍රශ්ණයට මුලසුනෙන් පිළිතුරු ලබාදුන් අතර මූල්‍ය වාර්තා දෙකම සභා සම්මත කර ගන්නා ලදී

අනතුරුව, මධ්‍යම කාරක සභිකයින් වෙත සපයා තිබුණු මරණාධාර අරමුදලේ ලේකම් වාර්තාව එහි සභාපති කේ. ටී. කරුණාරත්න මහතාගේ දීර්ඝ කරුනු පැහැදිලි කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත කර ගන්නා ලදී.

මරණාධාර අරමුදලේ ගරු භාණ්ඩාගාරික ඩබ්. ජී. ජයවික්‍රම මහතා විසින් ඉදිරිපත් කර තිබුණු 2020/2021 සහ 2021/2022 වසර දෙක සඳහා වූ ගිණුම් වාර්තා ද ඒ මහතාගේ කරුණු දැක්වීමෙන් අනතුරුව සභා සම්මත කර ගන්නා ලදී.

## <u>මහා සාමාජිකත්වයේ යෝජනා</u>

වාර්ෂික මහා සභාවේ දී සිරිත් පරිදි සිදු කෙරෙන සාමාජික යෝජනා කැඳවීම මෙවරද සිදු කෙරුණු අතර, ඉදිරිපත් වූ යෝජනා අතුරින් උපදේශක සභාවේ නිර්දේශයෙන් මතු කියවෙන යෝජනා මෙවර සංවත්සර මහා සභාවට ඉදිරිපත් කරනු ලැබ සභා සම්මත විය.

### 1. ණය පොලී අඩු කිරීම (අනුරාධපුර, මහනුවර හා මාතලේ දිස්ත්‍රික්ක වල යෝජනාවකි.)

බැංකුවේ විශ්‍රාමික ප්‍රජාවට ලබාදෙන පුද්ගලික ණය සඳහා බැංකුව විසින් අය කෙරෙන අවම පොලී අනුපාත අය කරන ලෙසත්, ණය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කල යුතු රක්ෂණාවරනය ණය ඉල්ලුම්කරුට අභිමත රක්ෂණ ආයතනයකින් ලබා ගැනීමට අවස්ථාව සලසන ලෙසත්, කළමනාකාරිත්වයෙන් ඉල්ලා සිටීම.

### 2. ආරුගම්බේ ප්‍රදේශයේ නිවාඩු නිකේතනයක් / වැඩිහිටි නිවාසයක් ගොඩනැංවීම (අම්පාර දිස්ත්‍රික්කයේ යෝජනාවකි.)

ආරුගම්බේ, පොතුවිල් ආසන්නයේ අක්කරයකට නොඅඩු ඉඩමක් මිලට ගෙන, අපගේ කතරගම නිවාඩු නිකේතනයට සමාන, ලාභ ලබන පදනමෙන් පවත්වාගෙන යන නිවාඩු නිකේතනයක් හා එයටම යාබදව - විශ්‍රාමික සාමාජිකයන් සඳහා වන වියදම් පියවා ගැනීමේ පදනමින් පවත්වාගෙන යන වැඩිහිටි නිවාසයක් ගොඩනැංවීමට බැංකු කලමනාකාරිත්වයෙන් ඉල්ලා සිටීම.

## 3. වසරකට එක් ණය වාරිකයක් පමා කර ගෙවීමට හැකිවනසේ ණය වාරික යලි සැකසීම (අම්පාර දිස්ත්‍රික්කයේ යෝජනාවකි. )

ණය ගනු ලබන විශ්‍රාමිකයන්ගේ කැමැත්ත පරිදි, ඔවුන්ට වැදගත් වන උත්සවයක් පැවැත්වෙන එක් මාසයක ණය වාරිකය පමා කර ණය ආපසු ගෙවීම සඳහා ණය වාරිකය යලි ගනණය කිරීමේ පහසුකම විශ්‍රාමිකයන්ට ලබා දෙන ලෙස කළමනාකාරිත්වයෙන් ඉල්ලා සිටීම්.

## 4.වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු අර්ථලාභින්ගේ ගැටළුව (කොළඹ දිස්ත්‍රික්කයේ යෝජනාවකි. )

වැන්දඹු /වැන්දඹු පුරුෂ හා අනත්දරු අර්ථලාභීන්ට එම අරමුදලේ වාර්ෂික මහා සභාවට සහ ඒ සම්බන්ධයෙන් වන අනෙකුත් රැස්වීම්වලට සහභාගිවීමේ අවස්ථාව ලබා දෙන ලෙසට බැංකු කළමනාකාරිත්වයට යෝජනා කිරීම.

## 5. වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදල් කළමනාකාරිත්වය නියෝජනය කිරීම (කොළඹ දිස්ත්‍රික්කයේ යෝජනාවකි. )

වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලේ පාලන කටයුතු සඳහා සහභාගීවන විශ්‍රාමිකයින්ගේ නියෝජනය 2 සිට 4 දක්වා වැඩි කරන ලෙසත්, අරමුදලේ කළමනාකරන රැස්වීම් තුන්මසකට වරක් නොව සෑම මසකටම වරක් පවත්වන ලෙසත්, මේ සඳහා වන නිතී රීති අවශ්‍ය පරිදි සංශෝධනය කරන ලෙසත්, අටදහසක් පමණ වන විශ්‍රාමිකයන් වෙනුවෙන් බැංකුවේ කළමනාකාරිත්වයට යෝජනා කර සිටීම.

## 6. වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලේ ආයෝජන කමිටුව නියෝජනය කිරීම. (කොළඹ දිස්ත්‍රික්කයේ යෝජනවකි.)

ලංකා බැංකුවේ වැන්දඹු හා අනත්දරු අරමුදලේ පාලන කටයුතු සඳහා ආයෝජන කමිටුවක් පත්කරන ලෙස ලංකා බැංකු කළමනාකාරිත්වයට යෝජනා කිරීම. ඒ සඳහා වැන්දඹු සාමාජිකයන් තිදෙනෙකු ඇතුලත් කිරීමටත්, වැන්දඹු අනත්දරු සාමාජික සාමාජිකාවන්ගේ හා ඔවුන්ගේ අර්ථලාභීන් නියෝජනය වීම සඳහා අවශ්‍ය වන නිතී රීතීන් යථාවත් කරන ලෙසත්, බැංකු කළමනාකාරිත්වයට යෝජනා කිරීම.

වාර්ෂික මහා සභාවට පැමිණ සිටි නියෝජිතයින්ගේ වැඩි ඡන්දයෙන් සම්මත කළ යුතු පහත යෝජනා (අංක 1 හා 2 ව්‍යවස්ථාවට අනුව) සම්මත කර ගැනීම මෙහිදී සිදු විය.

1. ලංකා බැංකු විශ්‍රාමිකයින්ගේ මරණාධාර අරමුදල යටතේ ලබාදෙන ප්‍රතිලාභ රු : 80,000/- සිට රු : 100,000/- දක්වා වැඩි කිරීම.
2. වැන්දඹු හා වැන්දඹු පුරුෂ හා අනත්දරු මරණාධාර අරමුදලේ ලබා දෙන ප්‍රතිලාභ රු : 40,000/- සිට රු : 60,000/- දක්වා වැඩි කිරීම.

මෙම වැඩි කිරීම 2022 ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක කිරීමට ද තීරණය කරන ලදී.

ආරම්භයේ සිටම මෙම අරමුදල සතු මුදල් කලින් කල සිටි මරණාධාර අරමුදල් කමිටු විසින් ඉතාමත් සුපරික්ෂාකාරිව වගකීමෙන් යුතුව ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් ආදියෙහි ආයෝජනය කර ඇත. මේ වන විටත් ලබාගත හැකි වූ වැඩිම පොලී අනුපාතිකයන් යටතේ එම මුදල් ආයෝජනය කර ඇත.

## 42 සංවත්සර මහා සභාවේ දී තෝරාපත් කරගත් 2022 /2023 වර්ෂයේ සංගමයේ නව නිලධාරී මණ්ඩලය

### ලංකා බැංකුවේ විශ්‍රාමිකයින්ගේ සංගමය

| තනතුර | නම |
|---|---|
| ගරු සභාපති | එම්. සුකුමාරන් මහතා |
| ගරු ප්‍රධාන ලේකම් | වී. රාජේන්ද්‍රන් මහතා |
| ගරු උප සභාපති | ජිනදාස ගමගේ මහතා |
| | නිහාල් ගමගේ මහතා |
| | ලලිත් හේමසිරි මහතා |
| ගරු භාණ්ඩාගාරික | විමල් ප්‍රනාන්දු මහතා |
| ගරු උප ලේකම් | ලාල් රොද්‍රිගු මහතා |
| | ඒ. ජී. තක්සල මහතා |
| ගරු උප භාණ්ඩාගාරික | කිංස්ලි මෙන්ඩිස් මහතා |
| ගරු ආසන්නතම හිටපු සභාපති | එල්.ජී. අබේසිරි ගුණවර්ධන මහතා |

ගරු කමිටු සාමාජිකයන්

* එන්. කේ. දහනායක මහතා
* එම්. වික්‍රමසිංහ මහතා
* එච්. එල්. ඒ. වනිගසේකර මහතා
* එම්. එෆ්. එස්. ඩබ්. ස්ටෙම්බෝ මහතා
* එන්. ඒ. බී. විතානගේ මහතා
* පී. වීරසිංහ මහතා
* ගාමිණී සිල්වා මහතා
* පී. වී. ලීලාරත්න මහතා
* පී. වී. එස්. ප්‍රේමලාල් මහතා (නිරීක්ෂක සාමාජික)

### ලංකා බැංකුවේ විශ්‍රාමිකයින්ගේ සංගමයේ මරණාධාර අරමුදල

| තනතුර | නම |
|---|---|
| ගරු සභාපති | කේ. ටී. කරුණාරත්න මහතා |
| ගරු ලේකම් | එම්. සරත් ශ්‍රිලාල් පෙරේරා මහතා |
| ගරු උප සභාපති | ඩබ්.ඒ.එම්. ධර්මදාස අබේසිංහ මහතා |
| ගරු භාණ්ඩාගාරික | ඩබ්. ජී. ජයවික්‍රම මහතා |
| ගරු උප ලේකම් | එන්.එම්.ආර්.එන්. තිලකරත්න මහතා |
| ගරු උප භාණ්ඩාගාරික | ටී. එම්. යූ. සේනානායක මහතා |
| කමිටු සාමාජිකයන් :- | ආර්. ඒ. විජේසිරි මහතා |
| | ඩබ්. සී. ආරියසේන මහතා |
| | කේ.එම්.කේ.එම්. ප්‍රනාන්දු මහත්මිය |
| | කේ. එල්. ඒ. හේමරත්න මහතා |
| | වයි.එම්.ඩී. යාපා බණ්ඩාර මහතා |

පළපුරුදු බැංකුකරුවන් හා සමාජ ක්‍රියාකාරීන්ගෙන් සැදුම්ලත් නව නිලධාරී මණ්ඩලයට මහා සාමාජිකත්වයේ අපේක්ෂාවෙන් ඉටු කිරීමට හැකි වනු ඇතැයි විශ්වාසය පලකර සිටිමු.

## යහපත් සන්නිවේදන සංස්කෘතියන් ගොඩනගමු.

ලංකා බැංකුවේ විශ්‍රාමිකයින්ගේ සංගමය එහි දීර්ඝ ඉතිහාසය තුල, සිය සාමාජිකත්වය සමග මනා සන්නිවේදන සම්බන්ධතාවයක් පවත්වාගෙන ආ බව ප්‍රකට කරුණකි. විශේෂයෙන්ම මව් සංගමයේ නිලමණ්ඩල සිය දිස්ත්‍රික් සංවිධානය හා ප්‍රාදේශීය සංවිධාන ජාලය හරහා සංගමයේ මහා සාමාජිකත්වය සමග ඉහළ සිට පහළටත් - පහළ සිට ඉහළටත් සක්‍රියව සිදු කෙරුණු වාචික සන්නිවේදනයක නිරත වී සිටියා මෙන්ම, ලිපි ලේඛන හා නිල විවරණිකා හරහා කෙරුණු මුද්‍රිත මාධ්‍යය සන්නිවේදනයකද එකසේ නිරත වී සිටියේය. කෙසේ වෙතත් 2019 වසරේ සිට අපට මෙන්ම ගෝලීය ජනයාට එකසේ මුහුණදීමට සිදුවූ කොවිඩ් 19 වසංගතයේ බලපෑම හමුවේ වරින්වර රට අගුලුලෑම හේතු කොට ගෙන රැස්වීම් පැවැත්වීම සීමා කිරීමට සිදුවීම නිසාත්, තදබල ලෙස මතුව ආ ආර්ථික අර්බුදයේ සෘජු ප්‍රතිඵලයක් ලෙස අප මුහුණදෙන ප්‍රවාහන දුෂ්කරතාවයන් නිසාත්, සුපුරුදු ක්‍රියාකාරකම් යම් යම් සීමාවන්ට යටත්ව අවම මට්ටමක පවත්වාගෙන යාමට සිදුවීම නොවැළැක්විය හැකිවූ බැවින්, පෙර පැවති යහපත් සන්නිවේදන සංස්කෘතියේ අඩාලවීමක් සිදු වූ බව නොරහසකි.

මෙම තත්වය ජයගැනීමේ අරමුණින්, මාර්ගගත ක්‍රමවේදයන් හරහා රැස්වීම් පැවැත්වීමට හා සන්නිවේදන කටයුතු කිරීමට ගනුලැබූ උපාය මාර්ගික පියවරයන්ද බලාපොරොත්තු වූ මට්ටමේ සාර්ථකත්වයක් අත්කර ගනු නොලැබූ බව අපගේ හැගීමයි.

කෙසේ වෙතත්, මේ වන විට සංගමයේ නිල මණ්ඩලවල රැස්වීම් පැවැත්වීම හා දෛනික මෙහෙයුම් කටයුතු යලි සක්‍රිය කර ඇති පසුබිමක යහපත් සන්නිවේදන සංස්කෘතියක් පවත්වාගෙන යාමට සංගමය සෑම උත්සාහයක්ම දරමින් සිටී. සංගමයේ නිල තොරතුරු විවරණිකාව නිකුත් කිරීම යාවත්කාලින කිරීමද එහි එක් පියවරකි.

මෙම ක්‍රියාවලියේ සාර්ථකත්වය උදෙසා සංගමයේ සියළුම ක්‍රියාධරයින්ගේ උපරිම කැපවීම අත්‍යාවශ්‍ය වනු ඇත.

## ජ්‍යෙෂ්ඨ ලේඛකයින්ට උපහාර පුදන්නට සංගමය ලංකා බැංකුවේ සිංහල සාහිත්‍යය සංගමය සමග අත්වැල් බැඳගනී.

ලංකා බැංකුවේ සිංහල සාහිත්‍යය සංගමයේ වජ්‍ර ජයන්ති උත්සවය සමරා ඔවුන් විසින් සංවිධානය කල අන්තර් බැංකු නිර්මාණ තරගාවලියේ ත්‍යාග ප්‍රදානෝත්සවයේදී, ජාතික මට්ටමේ සාහිත්‍යය සම්මාන හිමිකර ගත් අප සංගමයේ සාහිත්‍යකරුවන් හය දෙනෙකු, විශේෂ අගය කිරීමකට ලක් කරමින් උපහාර පුදන ලදී. මේ සඳහා සාහිත්‍යය සංගමයේ ආරාධනයෙන් අප සංගමය එම සාහිත්‍යධරයින්ට ත්‍යාග පිරි නැමීමට ඉදිරිපත් වූ අතර අන්තර් බැංකු නිර්මාන තරගයේ ජයග්‍රාහකයින් සඳහා පොත් පත් පරිත්‍යාග කිරීමට ද පියවර ගනු ලැබිය.

පසුගිය සැප්තැම්බර් 23 වන දින ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් සහ අප සංගමයේ ගරු සභාපති එම්. සුකුමාරන් හා ගරු ලේකම් වී. රාජේන්ද්‍රන් යන මහත්වරුන්ගේ සහභාගීත්වයෙන් කොළඹ ශ්‍රී ලංකා බැංකු කරුවන්ගේ ආයතනයේ ශ්‍රවණාගාරයේදී පවත්වනු ලැබූ උළලේදී සම්මානයට පාත්‍ර වූයේ,

* චම්මින්ද වෙලගෙදර මහතා
* මධුළු ගිරියේ විජේරත්න මහතා
* බන්දුල අබේසේකර මහතා
* සත්‍යපාල ගල්කැටිය මහතා
* ගාමිණී ප්‍රනාන්දු මහතා
* දේ.වී. ගාල්ලගේ මහතා

යන ජ්‍යෙෂ්ඨ විශ්‍රමික බැංකු කරුවන්ය.

අපගේ ගෞරවනීය ආචාරය ඔවුන්වෙත පුදකර සිටිමු.!!

## අභාවප්‍රාප්ත දිස්ත්‍රික් නායකයින්ට ආචාරය !

දීර්ඝ කාලයක් පොදුවේ ලංකා බැංකුවටත් විශේෂයෙන්ම විශ්‍රාමික සංගමයේ දිස්ත්‍රික්ක සංවිධානයන්ටත් ඉමහත් සේවාවක් ඉටුකළ කෑගල්ල දිස්ත්‍රික්කයේ ජී.ආර්.එච්. බණ්ඩාර, කුරුණෑගල දිස්ත්‍රික්කයේ එස්.ජේ.ආර්. සෙනරත්, නුවරඑළිය දිස්ත්‍රික්කයේ කේ.එම්.පී.ජී.ඒ. කැකුලන්දර යන මහත්වරුන්ගේ අභාවයන් පිළිබඳ ඉමහත් සංවේගයට පත්ව සංගමය ඔවුන් වෙනුවෙන් සිය ගෞරවනීය ආචාරය පුදකර සිටී.!

අප සංගමයේ මරණාධාර අරමුදලේ ගරු ලේකම් වශයෙන් සහ කළමනාකරන කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් සුවිශේෂ කාර්යභාරයක් ඉටුකළ ඩී.එස්.බී. වනසිංහ මහතාගේ අභාවය සම්බන්ධයෙන් ද සංගමය සිය බලවත් සංවේගය පල කර සිටී. විශ්‍රාම වැටුප් වැඩිකර ගැනීමේ ක්‍රියාවලියේදී දීර්ඝ කාලයක් අදාල සංඛ්‍යා දත්ත පිළියෙල කර දීමෙන් එතුමා විශාල දායකත්වයක් ලබාදුන් බවද ගෞරවයෙන් සිහිපත් කරමු. එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරමු.

## විශේෂ වෛද්‍යාධාර අරමුදල් ක්‍රමය (SRF) යටතේ 2020 /2021 වර්ෂ සඳහා ගෙවන ලද ගෙවීම්

## 2020 වර්ෂය

1. මෙම වසර තුල එස්.ආර්.එෆ්. 1 එම්. යටතේ සාමාජිකයන් 28 දෙනෙකු වෙනුවෙන් රු. මිලියන 1. 3 ක මුදලක් විශ්‍රාමිකයන් හා වැන්දඹු / වැන්දඹු පුරුෂ අනන්දරු සාමාජිකයන් වෙනුවෙන් වෛද්‍යාධාර ලෙස ගෙවීම් සිදු කර ඇත.
2. මෙම වසර තුල එස්. ආර්. එෆ්. 2 යටතේ සාමාජිකයන් 61 දෙනෙකු වෙනුවෙන් රු. 250,000 ක මුදලක් විශ්‍රාමිකයන් හා වැන්දඹු / වැන්දඹු පුරුෂ අනන්දරු සාමාජිකයන් වෙනුවෙන් වෛද්‍යාධාර ලෙස ගෙවීම් සිදු කර ඇත.

## 2021 වර්ෂය

1. මෙම වසර තුල එස්. ආර්. එෆ්. 1 එම්. යටතේ සාමාජිකයන් 82 දෙනෙකු වෙනුවෙන් රු. මිලියන 3. 6 ක මුදලක් විශ්‍රාමිකයන් හා වැන්දඹු / වැන්දඹු පුරුෂ අනන්දරු සාමාජිකයන් වෙනුවෙන් වෛද්‍යාධාර ලෙස ගෙවීම් සිදු කර ඇත. තවද මෙයින් සාමාජිකයන් 28 දෙනෙකු වෙනුවෙන් කොවිඩ් 19 වැළඳීම හේතුවෙන් රු. මිලියන 1. 2 ක මුදලක් විශේෂ සහන අරමුදල යටතේ ගෙවීම් සිදුකර ඇත.
2. මෙම වසර තුල එස්. ආර්. එෆ්. 2 යටතේ සාමාජිකයන් 84 දෙනෙකු වෙනුවෙන් රු. 360,000 ක මුදලක් විශ්‍රාමිකයන් හා වැන්දඹු / වැන්දඹු පුරුෂ අනන්දරු සාමාජිකයන් වෙනුවෙන් වෛද්‍යාධාර ලෙස ගෙවීම් සිදු කර ඇත.

(2022 මැයි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක වන විශේෂ වෛද්‍යාධාර ක්‍රමය පිළිබඳ චක්‍රලේඛය ලඟදීම විවරණිකාවක් ලෙස දිස්ත්‍රික් ශාඛා සංගම් මගින් සාමාජිකත්වය වෙත එවීමට කටයුතු කරන්නෙමු. )

## මරණාධාර අරමුදල

## 2020 වර්ෂය සඳහා

1. මෙම වසර තුල මියගිය විශ්‍රාමිකයින් සහ වැන්දඹු සාමාජිකයින් 96 දෙනෙකු වෙනුවෙන් හා විශ්‍රාමිකයන්ගේ කලත්‍රයින් 35 දෙනෙකු වෙනුවෙන් රු. මිලියන 8.97 ක මුදලක් විශ්‍රාමිකයින්ගේ මරණාධාර අරමුදලින් ගෙවීම් කර ඇත.
2. වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනන්දරු සාමාජිකයින් වෙනුවෙන් මරණාධාර අරමුදලින් රු. 680,000/- ක මුදලක් ද ගෙවීම් කර ඇත

## කොවිඩ් කාලසීමාව තුල මරණාධාර ගෙවීම

මෙම කාල කාලසීමාවේ දී (වසර දෙකක) රට වසා දැමීම නිසා විශ්‍රාමික සංගම් කාර්යාලය පවා දින 201 ක කාලයක් වසා දැමීමට සිදු විය. එසේ වුවද ලංකා බැංකුවේ විශ්‍රාම නඩත්තු දෙපාර්තමේන්තුවේ ද සහය ඇතිව මිය ගිය සියලු සාමාජිකයන්ගේ මරණාධාර ගෙවීම කිසිදු ප්‍රමාදයකින් තොරව අයදුම්පත් ලද විගස ගෙවීම් කිරීම සඳහා කටයුතු කරන ලද බව සටහන් කර තබමු.

## මරණාධාර අරමුදලට නොබැඳුණු සාමාජිකයන්

ගතවූ කාලය තුලදී මෙතෙක් අරමුදලට නොබැඳුණු සාමාජිකයන් හැකිතාක් දුරට දැනුවත් කර මෙම අරමුදලට දායක වීමේ වාසි පැහැදිලි කර අලුතින් සාමාජිකත්වය ලබා දෙන ලදී. බොහෝ දෙනෙකු හිඟ දායක මුදල් ගෙවා අරමුදලේ සාමාජිකත්වය ලබා ගන්නා ලදී.

තමාගේ විශ්‍රාම වැටුප් පත්‍රිකාව තමා විශ්‍රාම වැටුප ලබන බැංකු ශාඛාවෙන් ලබාගෙන එය පරීක්ෂා කර බලා මාසික වැටුපෙන් මරණාධාර අරමුදලට දායක මුදල් අඩු වන්නේ දැයි තහවුරු කරගන්නා ලෙසත් එසේ අඩු නොවන යම් විශ්‍රාමිකයෙකු හෝ වැන්දඹු / වැන්දඹු පුරුෂ සාමාජිකයෙකු වේ නම් ඒ බව අප සංගමය වෙත දැනුම් දී සාමාජිකත්වය ලබා ගැනීමට කටයුතු කරන ලෙසද කාරුණිකව දන්වා සිටිමු.

## සහන සැලසීමට සංගමය පෙරට


කොවිඩ් රෝගය වැළඳුනු පවුල් සඳහා සහනාධාර මුදාහැරීමට දිස්ත්‍රික් සංවිධානවලට අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව එම සහනාධාර වැඩ පිළිවෙල ක්‍රියාත්මක කළ සියළුම දිස්ත්‍රික් නායකත්වයට මව් සංගමයේ ප්‍රණාමය පුද කරන්නෙමු.

## සමාජ සත්කාර

රට තුල මෑතකදී මතු වූ අර්බුදකාරී තත්වයන් හේතුවෙන් සෞඛ්‍ය (ක්ෂේත්‍රයේ) ඇති වූ අත්‍යවශය වෛද්‍ය උපකරණ ඌණතාවයන් අවම කිරීමේ අරමුණින් රුපියල් 1,497,440/- ක් වටිනා වෛද්‍ය උපකරණ තොගයක් කොළඹ ජාතික මහා රෝහලටත් බොරැල්ලේ රිජ්වේ ආර්යා ළමා රෝහලටත් අගෝස්තු මස තුල සපයන ලදී. මෙම වියදම දරණ ලද්දේ සංගමයේ ඉල්ලීම මත සාමාජිකත්වය විසින් ස්වේච්ඡාවෙන් කරන ලද මුදල් පරිත්‍යාගයන්ගෙනි. මේ සඳහා මුදල් පරිත්‍යාගයන් කළ සියළු සාමාජික සාමාජිකාවන්ට සංගමයේ ස්තුතිය පිරිනමමු !



වෛද්‍ය උපකරණ බාරදුන් අවස්ථාව



ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය
உயிரியல் மருத்துவ பொறியியல் சேவைகள் பிரிவு
Division of Biomedical Engineering Services
27, ද සේරම් පෙදෙස, කොළඹ 10. 27, டி சேரம் வீதி, கொழும்பு 10. 27, De Saram Place, Colombo 10

Ministry of Health

My No. BES/PL/A/12/2020 Vol I    Your No.    Date 07.09.2020

General Secretary,
Bank of Ceylon,
Pensioners Association.

**Acknowledgement of Donation of Medical Equipment.**

We hereby acknowledge your valuable donation of 7 Nos of Syringe Pumps on the 7th September 2022.

We would kindly request you to continue supporting the Ministry of Health in these difficult times our country is facing.

Thank you,
Your faithfully,

S.A.J. Karunathilake,
Deputy Director General (Acting),
Division of Biomedical Engineering Services.

S.A.J. Karunathilake
Act. Deputy Director General
(Biomedical Engineering Services)
Department of Health Services
27, De Saram Place, Colombo 10.

වෛද්‍ය උපකරණ බාර ගනිමින් ස්තුතිය එළකිරීමේ ලිපිය

## විශ්‍රාම වැටුප් සංශෝධනය

විශ්‍රාම වැටුප වැඩි කිරීම සඳහා කරන ලද ඉල්ලීමට ප්‍රතිචාරයක් ලෙස කළමනාකාරීත්වය විසින් 2022 වසරේ සිට සෑම විශ්‍රාමිකයෙකුටම අවමය රු. 5,000/- බැගින් වූ විශ්‍රාම වැටුප් වැඩිකිරීමක් සිදු කළ අතර, 2008 පෙර විශ්‍රාමගිය කළමනාකාර ශ්‍රේණියෙන් ඉහල ශ්‍රේණි සඳහා රු. 5,000/- සිට රු. 10,000/- දක්වා ශ්‍රේණිය හා ජ්‍යෙෂ්ඨත්වය අනුව වැඩි කිරීමක් ලබා දීමටත් කටයුතු කරන ලදී.

## විසඳා ගැනීමට ඇති ගැටළු

මෙතෙක් නොවිසඳුනු ප්‍රධාන ඉල්ලීම් දෙක අතුරින් වෛද්‍ය සහනාධාර සංශෝධනය පිළිබඳව, සංගමය මෙතෙක් දැරූ උත්සාහයන්ට ප්‍රමාණවත් විසඳුමක් ලබා ගැනීමට නොහැකි වී ඇත. ඒ සඳහා ප්‍රමුඛතාවය දීම හේතුවෙන්ම කල් දැමුණු විශ්‍රාම වැටුප් විෂමතාවයන් නිරාකරණය කර ගැනීමේ අරමුණ ද ජයගත යුතුව තිබේ. ඉදිරියේ දී සංගමයේ නිලමණ්ඩල මේ කාරණ සම්බන්ධව වඩාත් කැපවීමෙන් කටයුතු කරනු ඇති බව සටහන් කරමු.

ඉදිරියේ දී විසඳා ගැනීමට ඇති ගැටළු පිළිබඳව සාකච්ඡා සඳහා හමුවීමට අවශ්‍ය වුවහොත් ඒ සඳහා සූදානමින් සිටින ලෙසට මහා සාමාජිකත්වය දැනුවත් කර සිටින්නෙමු.

බැංකුවේ පවත්නා නිළ වෘත්තීය සංගම් සමග ඉදිරියේ දී සහයෝගයෙන් කටයුතු කිරීමට ද වර්තමාන කළමනාකරන කමිටුව තීරණය කර ඇත.

## සාමාජිකත්ව සංඛ්‍යා

2022 ජූනි මාසයේ 30 වන දිනට සංගමයේ සාමාජිකත්වය

1. විශ්‍රාමික සාමාජිකයින් සංඛ්‍යාව 7,361 ක් වන අතර, මින් 7,204 දෙනෙකු මරණාධාර සංගමයේ සාමාජිකත්වය ලබාගෙන ඇත.
2. වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු සාමාජික සංඛ්‍යාව 1,813 ක් වන අතර, මින් 1369 දෙනෙකු මරණාධාර සංගමයේ සාමාජිකත්වය ලබාගෙන ඇත.

## විශ්‍රාම වැටුප් රිසිට්පත

මාසික විශ්‍රාම වැටුපට අදාල රිසිට්පත, මේ වන විට ඕනෑම ලංකා බැංකු ශාඛාවකින්, ලබා ගැනීමට බැංකුව විසින් අවස්ථාව සලසා දී ඇත.

## අඩු කළ ණය පොළී අනුපාත පිළිබඳ විශේෂ සටහන

බැංකු පොළී අනුපාත පසුගිය කාල වකවානුව සීඝ්‍ර ලෙස ඉහල යාම නිසා, විචල්‍ය පොළී අනුපාත යටතේ ජීවිත රක්ෂණය එල්ලේ විශ්‍රාමිකයින් ලබාගත් ණය සඳහා මාසිකව අය කෙරෙන ණය වාරික මුදල ඉතා ඉහල අගයක් කරා ගමන් කර ඇත.

මෙය ජීවන වියදමට සාපේක්ෂව බලන විට බරපතල ප්‍රශ්ණයක් වූ බැවින් අප සංගමය බැංකුවේ කළමනාකාරීත්වය සමග කිහිප විටක් සාකච්ඡා කරනු ලැබ එහි ප්‍රතිඵලයක් වශයෙන් එම ණය පොළී අනුපාතය 12.75% ක් දක්වා පහත හෙලමින් බැංකුව විසින් සංවර්ධන බැංකු අංශයේ මෙහෙයුම් උපදෙස් චක්‍රලේඛන අංක 363/2022 ට දෙවන එකතුව (2022/09/25) නිකුත් කර ඇත. ඒ අනුව 2022.04.11 දිනට පෙර ලබාගත් ණය සඳහා මෙම සහනදායි ක්‍රියා පිළිවෙල අදාල වේ.

**එම නිසා ජීවිත රක්ෂණය එල්ලේ සහ විචල්‍ය පොළී අනුපාතය යටතේ පුද්ගලික ණය** (Personal Loans) **ලබා ගත් විශ්‍රාමිකයින් තම බැංකු ශාඛාව මගින් අදාල සහනදායි ක්‍රියා පිළිවෙලට යොමු විය යුතුය.**

සාකච්ඡා මාර්ගයෙන් මෙම ගැටළුව විසඳා ගැනීමට හැකිවීම ගැන අප බෙහෙවින් සතුටට පත්වන අතර මේ සම්බන්ධයෙන් බැංකුවේ කළමනාකාරීත්වය වෙත අපගේ ගෞරවනීය ස්තූතිය එළකර සිටිමු.

## 2010 වෛද්‍යාධාර චක්‍රලේඛනය පිළිබඳව සාමාජිකත්වය අතර පතුරුවනු ලබන මතවාද පිළිබඳ පැහැදිලි කිරීමක්

සංගමයේ කළමනාකරණ කමිටු සාමාජිකයෙකු ලෙස කටයුතු කරන නිහාල් ගමගේ මහතා විසින් 2010 විශ්‍රාමික වෛද්‍යාධාර ක්‍රමයේ චක්‍රලේඛය නිකුත් කිරීමේ දී සාමාජික යන්ගේ අයිතිවාසිකම් අහිමිවන අයුරින් කටයුතු කර ඇතැයි යනුවෙන්, සමහර පුද්ගලයන් විසින් කරනු ලබන අසත්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් පසුගිය මස පැවැති සංගමයේ කළමනාකරණ කමිටුවේ දී සාකච්ඡාවට භාජන විය. එම චක්‍රලේඛය නිකුත් කරන විට විශ්‍රාම නඩත්තු අංශයේ සහකාර මහා කළමණාකරු වශයෙන් සේවය කල අවදියේ පැවති තත්වය පිළිබඳ තොරතුරු විමසා බැලීමකින් තොරව ඔහුට විරුද්ධව එවැනි චෝදනා ඉදිරිපත් කරන පුද්ගලයින් නොදන්නා පහත සඳහන් කරුණු ඔබගේ දැනුවත් විම සඳහා ඉදිරිපත් කරමු.

සාමාජිකයින්ගේ මෙම වරප්‍රසාද අහිමි කිරීම පිළිබඳ වැදගත් තොරතුරු සියල්ල සංගමයට ලබා ගැනීමට උපකාරි වුයේ නිහාල් ගමගේ මහතා බැව් දන්වනු කැමැත්තෙමු. එම තොරතුරු පදනම් කරගෙන 2015 වර්ෂයේ සිට සංගමය වෛද්‍යාධාර දීනා ගැනීම සඳහා අවස්ථා ගණනාවකදී කළමණාකාරිත්වයට ලිඛිත ඉල්ලීම් ඉදිරිපත් කරනු ලැබ ඇත. එපමණක් නොව මේ දක්වා සංගමය විසින් කළමණාකාරිත්වය සමග පැවැත්වූ සාකච්ඡා වලට සහභාගි වෙමින් නිහාල් ගමගේ මහතා විසින් වටිනා තොරතුරු රැසක් ඉදිරිපත් කළ බව සඳහන් කළ යුතුය.

මෙම වෛද්‍යාධාර යෝජනා ක්‍රමය අනුමත කර ගැනිම සඳහා 2010 වසර මුල සිට කිහිප වතාවක්ම අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කරමින් කටයුතු කලේ නිහාල් ගමගේ මහතාට පෙර සිටි සහකාර මහා කළමණාකරු විසිනි. එහෙත් 2010-12-15 දින එම වෛද්‍යාධාර ක්‍රමය අනුමත වන විට ඔහු විශ්‍රාම ලබා තිබුණි. මුල්දී, මෙම නව වෛද්‍යාධාර ක්‍රමය යටතේ විශ්‍රාමිකයන්ගේ වෛද්‍යාධාර බිල්පත් ගෙවීම සඳහා නව චක්‍රලේඛයක් නිකුත් නොකර, ඒ වන විට මානව සම්පත් අංශය ක්‍රියාත්මක කල සක්‍රිය සේවයේ වෛද්‍යාධාර ප්‍රතිපූර්ණ ක්‍රියා දාමයම විශ්‍රාමිකයින්ටද අනුගමනය කිරීමට නිහාල් ගමගේ මහතා විසින් අදහස් කර තිබී ඇත. එහෙත්, නව වෛද්‍යාධාර ක්‍රමයෙන් විශ්‍රාමිකයන්ගේ සේවා කාලය අනුව කොටස් තුනකට වර්ගීකරණය කොට තිබීම, බරපතල අසනීප සඳහා වූ 750,000/- විශ්‍රාමිකයාගේ කාලත්‍රයාට අහිමිවීම ආදී විෂමතා කිහිපයක් මත වෙනම චක්‍රලේඛයක් නිකුත් කිරීමට ඉහල කළමණාකාරිත්වයෙන් උපදෙස් ලැබී තිබූ නිසා විශ්‍රාම නඩත්තු අංශය චක්‍රලේඛයක් පිළියෙල කර තිබුණි. ඒ අතර තුර විශ්‍රාම ලබා සිටි සහකාර මහා කළමණාකරු විසින් ද චක්‍රලේඛයක් කෙටුම්පත් කොට බැංකුවේ එවකට සිටි සභාපති වරයා වෙත ඉදිරිපත් කර තිබූ අතර, එම චක්‍රලේඛය නිකුත් කරන ලෙස සභාපතිවරයා නිහාල් ගමගේ මහතාට උපදෙස් දී ඇත.

හිටපු සහකාර මහා කළමණාකරුගේ චක්‍රලේඛ කෙටුම්පත තුළ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවට පටහැනිවූ කරුනු කිහිපයක්ම ඇතුලත්ව තිබුණි. එක් අවස්ථාවක බැංකුවේ එවකට සිටි සභාපතිවරයා විසින් නියෝජ්‍ය මහා කළමණාකරු (මානව සම්පත්) හා නියෝජ්‍ය මහා කළමණාකරු (මුල්‍ය) සමග නිහාල් ගමගේ මහතාද කැඳවා හිටපු සහකාර මහා කළමණාකරු ඉදිරියේ තබා ගෙන ඔහුගේ චක්‍රලේඛය ගැන නොසලකා කටයුතු කිරීම පිළිබඳව ප්‍රශ්න කර ඇත. එම චක්‍රලේඛ කෙටුම්පත අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කල පත්‍රිකාව සමග නොගැලපුන නිසා එය ඉදිරිපත් නොකල බැව් සභාපතිවරයාට දන්වා ඇත. එමනිසා නිහාල් ගමගේ මහතා විසින් මෙම සිදුවීම් සියල්ල විශ්‍රාම භාර අරමුදලේ මාසික රැස්වීමට වාර්තා කර ඇත. ඒ අවස්ථාවේ එම රැස්වීමේ සභාපතිවරයා ලෙස කටයුතු කල, එවකට සිටි මහා කළමණාකාරතුමා විසින් චක්‍රලේඛය නිකුත් කිරීමේ කටයුතුවලින් විශ්‍රාම නඩත්තු අංශය ඉවත් කර මහා කළමණාකාරතුමා විසින් පත් කරන ලද කමිටුවක් විසින් චක්‍රලේඛය නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු සලසා ඇත. (සභාපතිවරයාගේ මැදිහත්වීමක් තිබූ නිසා මහා කළමණාකාරවරයා තනිව මෙම කාර්යයේ වගකීම ගැනීමෙන් වැලකීමට කමිටුවක් පත් කිරීමට කටයුතු කළා විය හැක. ) මෙම ක්‍රියා දාමයෙන් මාස 04 කට පසුව විශ්‍රාමිකයන් අතට පත්වුයේ මහා කළමණාකාරු ඇතුළු කමිටුව විසින් පිළියෙල කරන ලද එම චක්‍රලේඛයයි.

එම නිසා එම චක්‍රලේඛය පිලියෙල කිරීමේ දී නිහාල් ගමගේ මහතාගේ හෝ එම චක්‍රලේඛය සඳහා අත්සන් තබා ඇති අනික් පාර්ශවයන් වූ නියෝජ්‍ය මහා කළමණාකරු (මානව සම්පත්) හා නියෝජ්‍ය මහා කළමණාකරු (මුල්‍ය) විසින් හෝ කිසිදු දායකත්වයක් ලබාදී නොමැති බව දන්වා සිටිමු.

ප්‍රධාන ලේකම්

කළමනාකරණ කමිටුව වෙනුවෙන්

2022/10/20

**ලංකා බැංකුවේ විශ්‍රාමිකයින්ගේ සංගමය**
**4 වන මහල,**
**ලංකා බැංකුව - අගනුවර ශාඛාව,**
**61, රෝහල් වීදිය,**
**කොළඹ 01.**